# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023

### 2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

### සමාජීය විද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයන

### සංවර්ධන අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේද - DVST 28224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සංවර්ධන අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ පිළිබඳව හැදෑරීමේ වැදගත්කම සාධක පහක් (05) ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. අස්වැසුම ප්‍රතිලාභීන්ගේ ජීවන මට්ටමේ වෙනස්වීම් පිළිබඳව පර්යේෂණයක් කිරීමට ඔබට පැවරී ඇතැයි සිතන්න. එවැනි පර්යේෂණයක් සිදුකරන ආකාරය පියවර පහක් (05) යටතේ සංක්ෂිප්තව දක්වන්න.

(ලකුණු 20)

03. පර්යේෂණ ගැටලුව නිවැරදිව අර්ථකතනය කිරීම තුළින් සාර්ථක පර්යේෂණයක් කිරීමේ හැකියාව උචිත උදාහරණයක් ඇසුරින් පෙන්වා දෙන්න.

(ලකුණු 20)

04. පර්යේෂණයකදී සාහිත්‍ය විමර්ශනය සිදුකිරීමේ වැදගත්කම සාධක පහක් (05) ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. අ) සසම්භාවී නියැදුම් ක්‍රම හඳුන්වන්න. (ලකුණු 04)
   ආ) සසම්භාවී නියැදි ක්‍රම අතුරින් <u>දෙකක්</u> (02) තෝරාගෙන, ඒවා සංවර්ධන අධ්‍යයන විෂයට අදාළ පර්යේෂණ සඳහා යොදගෙත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8x2=16)

06. ආන්තික ජනකණ්ඩායම් සවිබලකරණය සඳහා ප්‍රජා මූලික පර්යේෂණ උපයුක්ත කරගත හැකි ආකාරය පරීක්ෂා කරන්න.

(ලකුණු 20)

07. අ) ප්‍රශ්නාවලියක් සැකසීමේදී අන්තර්ගතවිය යුතු මූලිකාංග හතරක් (04) දක්වන්න. (ලකුණු 04)
   ආ) ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමවේදය යොදාගැනීමේ වාසි හා අවාසි දෙක (02) බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)
   ඇ) ඉහත ඔබ දැක්වූ අවාසි මගහරවාගැනීමේ උපායමාර්ග කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

08. පහත මාතෘකා අතුරින් දෙකකට (02) කෙටි සටහන් සපයන්න.

(ලකුණු 10x2=20)

   අ) මිශ්‍ර පර්යේෂණ (Mixed methods Research)
   ආ) ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා (Unstructured Interviews)
   ඇ) සිද්ධි අධ්‍යයන (Case Studies)
   ඈ) ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (Focus Group Discussions)

*******************************